**බදුල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බදුල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මුළු වත්කම් රු.139,199,915 ක් වුවද, එදිනට මුළු හිමිකම් හා වගකීම් ශේෂය රු.139,731,405 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී පෙන්වාදී තිබුණු සමුච්චිත අරමුදල ඉදිරියට ගෙන ඒමේදී රු.9,967,555 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී රු.996,755 ක් පමණක් අවිනිශ්චිත ගිණුමකට හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ මුළු ලැබීම් රු.11,400,000 ක් සහ මුළු ගෙවීම් රු.10,883,507 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ඉටු කර තිබුණු කර්මාන්ත සඳහා ලැබිය යුතු අත රැඳවුම් මුදල් රු.755,527 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | 2016 වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබුණු සභා ගොඩනැඟිල්ලේ රු.38,122,896 ක නිමි වැඩ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේදී වත්කම් ලේඛනයට ඇතුළත් කර ගන්නා ලද බව. | -එම- |
| (ඊ) | ඉකුත් වර්ෂ වලදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය මඟින් ඉදිකර දී තිබුණු බොජුන්හල ගොඩනැඟිල්ල, වැසිකිළිය සහ වැට සඳහා වටිනාකම රු.13,137,223 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.33,039 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් ආපදා ණය රු.300,000 ක් ණයහිමියන් ලෙස වෙන්කර තිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී කසළ බදු ආදායම රු.70,000 ක් වැඩිපුර බිල් කර තිබුණි. | -එම- | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් රු.500,000 ක් විය යුතු වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.373,380 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ වාහන අලුත්වැඩියාවන් සඳහා සභා අරමුදලින් ගෙවා තිබුණු රු.372,505 ක් ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන තිබුණු රු.1,000,000 ක් වූ සූර්යබල විදී පහන් 69 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන වත්කම් ලෙස දක්වා නොතිබුණි. | -එම- | -එම- |

## 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 07 ක් පොදු ලෙජරයේ ලෙජර් ගිණුම්හි ශේෂයන් සමඟ රු.2,883,336 කින් නොසැසඳුනි. | පොදු ලෙජරයේ ලෙජර් ගිණුම් නිවැරදිව පිළියෙළ කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ හා අනුරූපී වාර්තා අනුව වෙනස්කම් අනාවරණය කර ශේෂ සැසඳීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 07 ක එකතුව සහ උපයෝගී පොත් සහ උපයෝගී ලේඛනවල එකතුව සමඟ රු.25,887,740 ක වෙනසක් විය. | ලේඛන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.5,264,647 ක ඉඩම් හා ගොඩනැඟිලි සහ තොග ශේෂය සනාථ කිරීම සඳහා ඔප්පු, පිඹුරුපත්, පැවරුම් නියෝග සහ තොග සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඔප්පු පිඹුරුපත් හා පැවරුම් නියෝග ලබා ගැනීමට හා තොග සමීක්ෂණ සිදු කිරීමට කටයුතු කරන බව. | ශේෂ සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 23 සහ 24 (1) වගන්ති | සභාවට අයත් මංමාවත් ස්ථිර සළකුණු සහ සීමා ලකුණු කර සැලසුම් පිළියෙල කර එම මංමාවත් සහ පටු මාවත්වල නාමලේඛනයක් දක්වමින් නියෝග වල නියම කර ඇති ආකාරයට දැන්වීම් පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ලේඛණගත කර දැන්වීම් පළ කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 සහ ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2/මු/1 හා 2005 මාර්තු 24 දිනැති ලිපිය | ඇප තැබිය යුතු නිලධාරීන් 09 ක් ඇප තබා නොතිබුණි. | 2023 වර්ෂයේදී ඇප තැබීමට කටයුතු කරන බව. | ඇප තැබිය යුතු සේවකයන් ඇප තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| | (i) 217 රීතිය | පී.එස් 46 ආකෘතිය ප්‍රකාරව සභාව සතු, සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සහ සභාව විසින් පදිංචියට ගන්නා ලද සියළුම ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ලේඛනය විධිමත්ව පවත්වා ගැනීමට විෂය නිලධාරී දැනුවත් කළ බව. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 218 රීතිය | සමාලෝචිත වර්ෂය සඳහා සියළු ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණය සඳහා කමිටුවක් පත් කිරීමට උපදෙස් දුන් බව. | වාර්ෂිකව වත්කම් සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,969,396 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,516,208 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්ත මේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 950,184 | 818,290 | 854,746 | (36,456) | 950,184 | 842,692 | 675,480 | 167,212 |
| | කුලී | 1,200,000 | 1,489,804 | 1,699,850 | (210,046) | 1,200,000 | 1,540,840 | 1,234,150 | 306,690 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 585,000 | 585,000 | 500,000 | 85,000 | 750,000 | 710,000 | 642,580 | 67,420 |
| (iii) | වෙනත් | 3,021,520 | 2,664,989 | 2,123,061 | 541,928 | 3,021,520 | 3,233,113 | 1,792,357 | 1,440,756 |
| | එකතුව | 5,756,704 | 5,558,083 | 5,177,657 | 380,426 | 5,921,704 | 6,326,645 | 4,344,567 | 1,982,078 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි ත්‍රීරෝද රථ ගාස්තු රු.135,980 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ඇත. දැනට බලාත්මක නොවන බැවින් නීතිය ක්‍රියාත්මක කිරීමට අපහසු වී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.3,035,149 ක් සහ මුද්දර ගාස්තු රු.6,702,054 ක් ගෙන්වා ගෙන නොතිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා උපලේඛන සකස්කර අදාළ ආයතන වෙත යොමු කර ඇති බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට ඖෂධ මිලදී ගැනීම සඳහා සභා අරමුදලින් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර, ඖෂධ සංස්ථාවෙන් ලබාදී තිබුණු රු.1,050,000 ක ඖෂධ වලින් රෝගීන් 1510 ක් සඳහා රු.272,723 ක ඖෂධ ප්‍රතිකාර පමණක් ලබාදී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 11 දින සිට ස්ථිර ආයුර්වේද වෛද්‍යවරයෙකුද සේවය කර නොතිබුණි. | ස්ථිර වෛද්‍යවරයෙක් නොමැති නිසා සභා අරමුදල් ප්‍රතිපාදන වලින් ඖෂධ ලබා නොගෙන ඖෂධ සංස්ථාවෙන් ලබා දෙන ඖෂධ පමණක් රෝගීන් වෙත ලබා දීම සිදු කළ බව. | මහජන සුභසාධනය සඳහා සෞඛ්‍ය සේවා පුළුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සභා අරමුදලින් රු.1,470,000 ක් වැය කර කුටි කාමර 05 ක් සහ රු.2,150,000 ක් වැය කර කසළ අංගනය වටා වැටක් ඉදිකර තිබුණි. වාර්ෂිකව එක්රැස් වන ටොන් 1,800 ක පමණ කසළ අදාළ භූමියේ අක්‍රමවත් ලෙස බැහැර කර තිබුණු අතර, කසළ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා කම්කරුවන් තිදෙනෙක් ,කොම්පැක්ටර් රථයක් සහ ට්‍රැක්ටර් රථ 02 ක් යොදවා තිබුණද, සභාව කාබනික පොහොර නිෂ්පාදනය සිදුකර නොතිබුණි. ඉදිකර තිබුණු කසළ අංගනය කසළ වෙන් කිරීමට, කොම්පෝස්ට් නිෂ්පාදනයට හෝ වෙනත් ඵලදායි කාර්යයකට භාවිතා නොකර නිෂ්කාර්යයව පැවතුණි. | නොදිරන කුණු වෙන් වෙන් වශයෙන් ගබඩා කිරීමට සැලසුම් කර ඇත. දිරන කුණු කාබනික පොහොර සාදා ගැනීමට සැලසුම් කර ඇති බව. | නොදිරන කසළ විධිමත්ව බැහැර කළ යුතුය. |